මාධ්‍ය නිවේදන අංක 19

# මැතිවරණ කොමිෂන් සභාව

මැතිවරණ කොමිෂන් සභාවේ පරිපාලනමය කටයුතු සම්බන්ධව අසත්‍ය හා සාවද්‍ය තොරතුරු පදනම් කර ගෙන යම් දේශපාලන පක්ෂ, සංවිධාන හා පුද්ගලයන් විසින් මාධ්‍ය හා සමාජ මාධ්‍ය මඟින් කරනු ලැබූ ප්‍රකාශ පිළිබඳව කොමිෂන් සභාවේ අවධානයට ලක්ව ඇත.

කොමිෂන් සභාව පත් වූ දින සිට මේ දක්වා නිදහස් හා සාධාරණ මැතිවරණ ක්‍රමයක් වෙනුවෙන් කරනු ලැබූ කාර්යයන් හා ප්‍රයත්නයන් පිළිබඳව නිහඬව සිටි මෙම සංවිධාන අසත්‍ය හා සාවද්‍ය කරුණු මත ස්වකීය දේශපාලන හෝ පටු අරමුණු උදෙසා ස්වාධීන කොමිෂන් සභා යොදා ගැනීම ඛේදජනක කාරණයකි. ජනතාව විසින් ගොඩනඟා ගත් ප්‍රජාතන්ත්‍රික ව්‍යුහයන් දුර්වල කිරීමට හා ජනතා විශ්වාසය බිඳ දැමීමට හේතු වන ලෙස කරනු ලබන මෙවැනි ප්‍රයත්න මඟින් ඔවුන් අපේක්ෂා කරනුයේ කුමන යහපත් සමාජයක් ද යන්න ගැටළුවකි. මෙම ප්‍රකාශවල සඳහන් කොමිෂන් සභාවේ ස්ථාන මාරුවීම් කටයුතු පිළිබඳව ප්‍රසිද්ධියේ කරුණු දැක්වීමට හැකියාව පැවතිය ද ඒවායේ දැක්වෙන පෞද්ගලික කරුණු කාරණා හේතු කොට ගෙන එසේ කිරීම සදාචාරමය නොවන බැවින් කොමිෂන් සභාව එයින් වැළකී සිටී. කෙසේ වෙතත් යම් දේශපාලන පක්ෂයකට හෝ සංවිධානයකට අවශ්‍ය නම් මැතිවරණ කොමසාරිස් ජනරාල්වරයා ඇමතීමෙන් අදාළ තොරතුරු පැහැදිලි කර ගැනීමේ හැකියාව පවතී. එසේම පසුගිය කාල වකවානුවල දී ස්වාධීන කොමිෂන් සභා අවශ්‍ය නොවන බවට ජනමතයක් ගොඩනැංවීමට තරම් පසුගිය කොමිෂන් සභාවලට ඇති වූ බලපෑම් හේතු වූ බව ද සිහිපත් කරනු ලබන අතර, කෙසේ වෙතත් මෙහිදී එම කරුණු ඉදිරිපත් කිරීමෙන් යම් පාර්ශ්වයකට අගතියක් හෝ තවත් පාර්ශ්වයකට ප්‍රවර්ධනයක් වීමට හේතු විය හැකි බැවින් ස්වාධීන කොමිෂන් සභාවක් ලෙස එවැනි තත්ත්වයට පත් වීමට ද මැතිවරණ කොමිෂන් සභාව සූදානම් නැත.

මැතිවරණ කොමිෂන් සභාව ස්වකීය කාර්යයන් හා කර්තව්‍යයන් ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට හා මැතිවරණ නීතිවලට අනුකූලව කරනු ලබන අතර, එහි දී විවිධ අදහස් හා සාධනීය විවේචනයන් අගය කරනු ලැබුව ද කිසියම් සංවිධානයක හෝ පුද්ගලයන්ගේ ඕනෑ එපාකම්වලට නතු වීමට සූදානම් නොමැති බව ද නිවේදනය කර සිටී.

සමන් ශ්‍රී රත්නායක
මැතිවරණ කොමසාරිස් ජනරාල්
මැතිවරණ කොමිෂන් සභාව

මැතිවරණ කොමිෂන් සභාව,
සරණ මාවත,
රාජගිරිය.
2021.07.16